# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
## (HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත,කොළඹ07,ශ්‍රී ලංකාව / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை,கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, BauddhalokaMawatha, Colombo 07, Sri Lanka

දුරකථනය(සාමාන්‍ය) / தொலைபேசி(பொது) / Telephone(General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address } directorhyg@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. } HYG/W/103
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2018/ 05/21

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක - 09**
2018.05.21 දින පෙරවරු 10.30ට නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල්.
ආපදා කළමණාකරන මධ්‍යස්ථානය.

**ගංවතුර අනතුරු ඇඟවීම් නිවේදනය - සියළුම ගංගා ධාරා ප්‍රදේශයන් සඳහා**

2018.05.20 දින ඇතිවූ වර්ෂාපතන තත්ත්වයේ අඩුවීමක් පසුගිය පැය කිහිපය තුළ වාර්තාවී ඇතත් ප්‍රධාන ගංගාවල පහළ ධාරා ප්‍රදේශයන්හි ජල මට්ටම් තවදුරටත් ඉහල යමින් පවතී. නිල්වලා ගඟ, ගිං ගඟ, කළු ගඟ, කැළණි ගඟ, අත්තනගලු ඔය,මහවැලි ගඟ හා මා ඔයෙහි ජල මට්ටම් මේ අනුව තවදුරටත් ඉහල යමින් පවතී.

**1. නිල්වලා ගඟ** - ඉහල ගංගා ධාරා ප්‍රදේශයේ ජල මට්ටම් (ඌරව හා පිටබැද්දර) අඩුවෙමින් පවතින අතර පිටබැද්දර ජල මට්ටම තවදුරටත් සුළු ගංවතුර මට්ටමේම පවතී. එහෙත් පහළ ගංගා ධාරා ප්‍රදේශය එනම් අකුරැස්ස ප්‍රදේශයෙන් (පානදුගම) පහල සුළු වශයෙන් ඉහළ යමින් පවතින අතර ජල මට්ටම තවදුරටත් මහ ගංවතුර මට්ටමේම පවතී. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> -මාතර, කඩවත් සතර, තිහගොඩ, මාලිම්බඩ කඹුරුපිටිය, අතුරලිය, අකුරැස්ස, පිටබැද්දර**

**2. ගිං ගඟ** - ඉහල ගංගා ධාරා ප්‍රදේශයේ එනම් තවලම ප්‍රදේශයේ ජල මට්ටම අඩුවෙමින් පැවතියත් එය තවදුරටත් මහ ගංවතුර මට්ටමේම පවතින අතර බද්දේගම ආශ්‍රිත පහළ ගංගා ධාරා ප්‍රදේශයේ ජල මට්ටම් සුළු ගංවතුර මට්ටමෙ පවතින අතර ඉදිරි පැය කීපය තුල තවදුරටත් සුළු වශයෙන් ඉහළ යා හැකිය. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> -බද්දෙගම, බෝපෙ පෝද්දල, වැලිවිටිය දිවිතුර, නාගොඩ, නියාගම, තවලම, නෙලුව**

**3. කළු ගඟ** - ඉහල ගංගා ධාරා ප්‍රදේශයේ රත්නපුර ආශ්‍රිතව පවතින සුළු ගංවතුර මට්ටම තවදුරටත් ඉක්මවා වැඩිවෙමින් පවතින අතර ඉහල ගංගා ධාරා ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනය මත තව දුරටත් ඉහළ යා හැකිය. එමෙන්ම පහල ගංගා ධාරා ප්‍රදේශයේ ජල මට්ටම් සුළු ගංවතුර තත්වයේ තවදුරටත් වැඩිවීමක් ඉදිරි පැය කීපය තුල සිදු විය හැකිය. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> - කලුතර දොඩම්ගොඩ, මිල්ලනිය, මදුරාවල, හොරණ, පාලින්දනුවර, බුලත්සිංහල, ඉංගිරිය,කිරිඇල්ල, කුරුවිට, ඇලපාත, රත්නපුර.**

**4. කැළණි ගඟ** - ඉහල ගංගා ධාරා ප්‍රදේශයේ දැරණියගල, කිතුල්ගල, හොලොම්බුව යන ජල මිනුම් ස්ථානවල ජල මට්ටම් අඩුවෙමින් පවතින අතර ගඟ පහළ ප්‍රදේශවල ( අවිස්සාවේල්ල සිට නාගලගම්වීදිය දක්වා) ජල මට්ටම් සුළු ගංවතුර මට්ටම දක්වා තවදුරටත් ඉහල යමින් පවතී. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> - කොළඹ, කැළණිය, කොලොන්නාව, බියගම, කඩුවෙල, හංවැල්ල, දොම්පේ, රුවන්වැල්ල, දෙහිඕවිට, දැරණියගල.**

**5. අත්තනගලු ඔය** - දැනට සුළු ගංවතුර මට්ටමේ ඇති අතර, ජල මට්ටම තව දුරටත් ඉහල යමින් පවතී. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> - මීගමුව, ජාඇල, කටාන, මිණුවන්ගොඩ, ගම්පහ, අත්තනගල්ල.**

**6. මා ඔය** - ගිරිඋල්ල ප්‍රදේශයේදී මහ ගංවතුර තත්ත්වය සුළු වශයෙන් අඩු වෙමින් පවතින, බඩල්ගම ආශ්‍රිත පහළ ධාරා ප්‍රදේශයේ ජල මට්ටම සුළු ගංවතුර මට්ටම දක්වා ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. **තර්ජනයට ලක් විය හැකි <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ</u> - පන්නල, දිවුලපිටිය, (පහත්බිම් සුළු වශෙයන්) ප්‍රධාන මාර්ගය යටවී නැත.**

7. මහවැලි ගඟ

මහවැලි ගගේ නාවලපිටිය හා පේරාදෙණිය ප්‍රදේශයන්හි ගගේ ජල මට්ටම අවධානය යොමු කල යුතු මට්ටම දක්වා ඉහල ගොස් ඇති අතර පහළ ධරා ප්‍රදේශයට සැළකිය යුතු වර්ෂාපතනයක් වාර්තා වී නොමැත.

එබැවින් ඉහත ගංගා ආශ්‍රිත පහත් බිම්වල වෙසෙන ජනතාවගෙන් හදිසි ගංවතුර තත්වයකින් ආරක්ෂාවීම සදහා දැඩි විමසිල්ලෙන් සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

එළඹෙන තත්ත්වයන් පිළිබදව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිරන්තර විමසිල්ලෙන් පසුවන අතර ගංගාවල ජල මට්ටම් ඉහළයාම සම්බන්ධයෙන් සුදුසු පරිදි කල්වේලා ඇතිව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉංජි.ආර්.එම්.එම්.ආර්.අලවතුගොඩ
වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා)

**පිටපත්-**

01. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ හා අ.ක.ස
02. අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (වි.ක්‍රි.සැ හා සැ) - දැ.ගැ.ස හා අ.ක.ස
03. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව / ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව / ස්වාධීන රූපවාහිනිය / සිරස / ස්වර්ණවාහිණී / දෙරණ / හිරු / සිටි F.M. / හිරු F.M. / රිදම් F.M.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date 21/05/18
Time 10.40
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE